# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 12,107 — 1960 අප්‍රේල් 14 වැනි බ්‍රහස්පතින්ද — 14.4.1960

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඞ කරන ලදි)

## III වැනි කොටස—ඉඩම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන් වෙනම පිටු අංක යොද ඇත)

| | | | පිට |
|---|---|---|---|
| ඉඩම් නිරවුල්කිරීම පිළිබඳ දැන්වීම් :— | | | |
| ප්‍රාරම්භක දැන්වීම් | ... | ... | — |
| අවසාන නියෝග | ... | ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරුන් විසින් ඉඩම් විකිණීම :— | | | |
| බස්නාහිර පළාත | ... | ... | — |
| මධ්‍යම පළාත | ... | ... | 175 |
| දකුණු පළාත | ... | ... | — |
| උතුරු පළාත | ... | ... | — |
| නැගෙනහිර පළාත | ... | ... | — |
| වයඹ පළාත | ... | ... | — |
| උතුරු මැද පළාත | ... | ... | — |
| ඌව පළාත | ... | ... | — |
| සබරගමු පළාත | ... | ... | — |

| | | | පිට |
|---|---|---|---|
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරීන් විසින් ඉඩම් විකිණීම :— | | | |
| බස්නාහිර පළාත | ... | ... | — |
| මධ්‍යම පළාත | ... | ... | — |
| දකුණු පළාත | ... | ... | — |
| උතුරු පළාත | ... | ... | — |
| නැගෙනහිර පළාත | ... | ... | — |
| වයඹ පළාත | ... | ... | — |
| උතුරු මැද පළාත | ... | ... | — |
| ඌව පළාත | ... | ... | — |
| සබරගමු පළාත | ... | ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් | | ... | 175 |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් | | ... | 177 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් | | ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් | ... | ... | 177 |
| ඉඩම් හිමි ගැමී ක්‍රමය යටතේ ඉඩම් දීම | | ... | — |

## ආණ්ඩුවේ ඒජන්තවරුන් විසින් ඉඩම් විකිණීම

ඉලක්කම 26.—මහනුවර දිසාවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1960 මැයි 16 වෙනි දින වූ සඳුදා උදේ 10 ට මහනුවර කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දු කරන්ට යෙදෙනවා ඇත. මහනුවර දිසාවේ උඩබුලත් ගම ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ පිහිටා තිබෙන බිම් කැබලි 1ක්.

මුල් සිතියමේ නොම්මරය පි.පී.ඒ. 1107.

බිම් කැබෙල්ලේ නොම්මරය : 4.

ඉඩමේ නම : මියන්පලවා වත්ත ; ගම : කඩවල ; ඉල්ලුම්කාරයාගේ නම : සී. ඊ. නානායක්කාර නෝනා මහත්මිය, 146/බී, දඹුල්ල පාර, කුරුණෑගල ; අයිතිකම කියාසිටින අයගේ නම : සී. ඊ. නානායක්කාර නෝනා මහත්මිය, 146/බී, දඹුල්ල පාර, කුරුණෑගල ; කොයි අන්දමේ ඉඩමක්ද යන වග : මිශ්‍ර වගාවන් සහ ගොඩ නැගිල්ලක් සහිත ඉඩම ; ප්‍රමාණය : අ. 4, රූ. 2, ප. 26 ; කච්චියේ තක්සේරු මිළ : රු. 166. ශ. 75.

ඉඩම පිළිබඳ වැඩි විස්තර මහ නුවර දිසාපතිගෙන්ද, එහි සිතියමක්, කොළඹ ප්‍රධාන මානකතැනගෙන්ද ලබාගත හැක.

ඊ. කේ. ආර්. අසරප්පා,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

1960 අප්‍රේල් 14 වෙනි දින,
කොළඹදීය.

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

අංකය: ජේ.58/59 ඊ125 ආර්/කිව් 243

### 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥාපනතින් සංශොධිත 1950හේ අංක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥාපනත

5 වෙනි වගන්තිය යටතේවූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනා කර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ විධි විධාන යටතේ ලබාගන්නා බවත් 1954 රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥාපනතින් සංශොධිත 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ කෘෂිකම් හා ඉඩම් පිළිබඳ ඇමතිවරයාවූ විජයානන්ද දහනායක නමැති මම මෙයින් ප්‍රකාශකරමි.

කොළඹ දිසාවේ, කොළඹ ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගේ කොට්ඨාශයේ, කොළොන්නාවේ පලාත් ආණ්ඩු සභාවේ සීමාවතුළ 7 වැනි කොට්ඨාශයේ පිහිටි වේරගොඩ පාරේ වරිපනම් අංක 5 දරණ මුළු ප්‍රමාණය පර්චස් 27.60ක් පමණවූ යාබද ඉඩම් කට්ටි දෙකට මායිම් වශයෙන් :—

උතුරට: පාඨශාලා භූමියෙන් සහ ලංකා බෞද්ධ අධ්‍යාපනික සංගමය විසින් අයිතිකම් කියනු ලබන වේරගොඩ පාරේ වරිපනම් අංක 3 දරණ ඉඩම; නැගෙණහිරට: කොටුවිල පී. ජේ. පෙරේරා නෝනාමහත්මිය විසින් අයිතිකම් කියනු ලබන වේර ගොඩ පාරේ වරිපනම් අංක 7 දරණ ඉඩම සහ වේරගොඩ පුරාණ

විහාරයට අයිති වේරගොඩ පාරේ වරිපනම් අංක 3/1, දරණ ඉඩම; දකුණට: සේදවත්ත—වේරගොඩ පාර; බස්නාහිරට: සී. චාල්ස් විජේගුණවර්ධන සහ තවත් අය විසින් අයිතිකම් කියනු ලබන වේරගොඩ පාරේ වරිපනම් අංක 5 දරණ ඉඩම.

ඩබ්ලිව්. දහනායක,
කෘෂිකර්ම හා ඉඩම් පිළිබඳ ඇමතිතුමා

1959 ක්වූ දෙසැම්බර් මස 24 වැනි දින,
කොළඹදීය.

---

අංකය: ජේ58/59 ඊ125 ආර්/කිච් 243

## 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධිත 1950හේ අංක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩමේ බුක්ති විශෙෂය පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධිතවූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ කෘෂිකර්ම හා ඉඩම් පිළිබඳ ඇමතිවරයාවූ විජයානන්ද දහනායක නමැති මම මෙයින් ප්‍රකාශකරමි.

**ඉඩමේ විස්තරය:** කොළඹ දිසාවේ, කොළඹ ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගේ කොට්ඨාශයේ, කොලොන්නාවේ පළාත් ආණ්ඩු සභාවේ සීමාවතුළ වේරගොඩ 7 වැනි කොට්ඨාශයේ පිහිටි වේරගොඩ පාරේ වරිපනම් අංක 22 දරණ ඉඩමෙන් ප්‍රමාණයෙන් පර්චස් 03.87 පමණ කොටසකට මායිම් වශයෙන්:—

උතුරට: සේදවත්ත-වේරගොඩ පාර; නැගෙණහිරට සහ බස්නාහිරට: එම ඉඩමේම ඉතිරි කොටස්වලින්; දකුණට: වේල්ලට වෙන් කරන ලද කොටස.

### බුක්ති විශෙෂය පිළිබඳ විස්තර

කොලොන්නාවට ජලය සැපයීමේ ක්‍රමය සඳහා ජලනල වැලලීම සහ නඩත්තු කිරීම පිළිබඳ අයිතිය.

ඩබ්ලිව්. දහනායක,
කෘෂිකර්ම හා ඉඩම් පිළිබඳ ඇමතිතුමා.

1959 ක්වූ දෙසැම්බර් මස 24 වැනි දින,
කොළඹදීය.

---

අංකය: ජේ.58/59 ඊ930; ආර්/කිච් 271

## 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධිත 1950හේ අංක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනා කර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954 රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධිත 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ කෘෂිකර්ම හා ඉඩම් පිළිබඳ ඇමතිවරයාවූ විජයානන්ද දහනායක නමැති මම මෙයින් ප්‍රකාශකරමි.

කොළඹ දිසාවේ, කොළඹ ප්‍රාදේශීය ආදායම් නිළධාරි තැනගේ කොට්ඨාශයේ, කෝට්ටේ ගල්කිස්ස ගම්කායයීි සභාවේ සීමාවතුල බොරලැස්ගමුවේ ගම්මුලාදෑනි තැනගේ වසමේ පිහිටි මුදල් පරවෙනි නාගහවත්ත නමැති ඉඩමෙන් ප්‍රමාණයෙන් අක්කර 1/2ක් පමණවූ ඉඩම් කොටසට මායිම් වශයෙන් :—

උතුරට: පැපිලියානේ විහාරස්ථානය විසින් අයිතිකම් කියනු ලබන එම ඉඩමේම කොටසක්; නැගෙණහිරට: ගල්හේනගේ ඒමිස් පෙරේරා සහ තවත් අය විසින් අයිතිකම් කියනු ලබන එම ඉඩමේම කොටසක්; දකුණට: මහරගම—දෙහිවළ ප්‍රසිද්ධ පාර; බස්නාහිරට: මුහන්දිරම් ඒ. වී. රත්නායක විසින් අයිතිකම් කියනු ලබන මැරවර ආච්චිගේ වත්ත නමැති ඉඩම.

ඩබ්ලිව්. දහනායක,
කෘෂිකර්ම හා ඉඩම් පිළිබඳ ඇමතිතුමා.

1960 ක්වූ පෙබරවාරි මස 28 වැනි දින,
කොළඹදීය.

## 1954 අංක 39 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධිත 1950හේ අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත

### 5 වැනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

පහත විස්තර කරන ඉඩම මහජන කායයීයක් සඳහා අවශ්‍යයයි ද, එබැවින් එම පනතේ විධිවිධාන යටතේ එය අත්කර ගනු ලැබේ යයි ද කෘෂිකර්ම සහ ඉඩම් අමාත්‍ය විජයානන්ද දහනායක වන මම, 1954 අංක 39 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධිත, 1950හේ අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි:—

මහනුවර දිස්ත්‍රික්කයේ පාතදුම්බර ප්‍රාදේශීය ආදායම් කොට්ඨාශයේ කුන්ඩසාලේ ගම්මුලාදෑනි වසමෙහි කුන්ඩසාලේ ගමෙහි පිහිටි ප්‍රමාණයෙන් අක්කර 9, රූඩ් 1, පර්චස් 24ක් පමණවූ (ඉඩම මැදින් වැටී ඇති ප්‍රසිද්ධ පාර හැර) මෙහි පහත මායිම් සඳහන් ඉඩම් කැබැල්ල:—

උතුරට: ඒ. බී. ආටිගල සහ ටී. සී. ද සිල්වා විසින් අයිතිය කියන තල්වත්ත නමැති ඉඩම; නැගෙණහිරට: සී. ඊ. තෙන්නකෝන් විසින් අයිතිය කියන තල්වත්ත නමැති ඉඩම; දකුණට: මහවැලි ගඟ; බස්නාහිරට: ඩී. ඇම්. අභයවර්ධන විසින් අයිතිය කියන තල්වත්ත නමැති ඉඩම.

සඳහන් අංකය: ජේ59/60 ඩබ්. 78-ඇල් ඩී/ඊ/32.

ඩබ්ලිව්. දහනායක,
කෘෂිකර්ම හා ඉඩම් පිළිබඳ ඇමතිතුමා.

1960 පෙබරවාරි මස 29 දින,
කොළඹදීය.

---

## 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධිත 1950හේ අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත

### 5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

පහත විස්තර කරන ඉඩම මහජන කායයීයක් සඳහා අවශ්‍යයයි ද, එබැවින් එම පනතේ විධිවිධාන යටතේ එය අත්කර ගනු ලැබේ යයි ද කෘෂිකර්ම සහ ඉඩම් අමාත්‍ය විජයානන්ද දහනායක වන මම, 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධිත, 1950හේ අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි :—

මහනුවර දිස්ත්‍රික්කයේ හාරිස්පත්තුව ප්‍රාදේශීය ආදායම් කොට්ඨාශයේ කුළුගම්මනසියපත්තුවේ හල්ලොලුව පල්ලේගම ගම් මූලාදෑනි වසමෙහි හල්ලොලුව ගමෙහි පිහිටි ප්‍රමාණයෙන් රූඩ්ස් 3ක් පමණවූ මෙහි පහත මායිම් සඳහන් දියදුලේහේන නොහොත් ගුරු මැටියේහේන සහ එරමුදුගොල්ලේහේන නමැති ඉඩම් වලින් කොටසක් :—

උතුරට සහ නැගෙනහිරට : එම ඉඩමේ ඉතිරි කොටස ; දකුණට : පේරාදෙණිය-හල්ලොලුව-කටුගස්තොට ප්‍රසිද්ධ පාර ; බස්නාහිරට : එම ඉඩමේ ඉතිරි කොටස.

සඳහන් අංකය : ජේ 59/60 ඩබ්. 46-ඇල් ඩී/ඊ/31.

ඩබ්ලිව්. දහනායක,
කෘෂිකර්ම සහ ඉඩම් ඇමති.

1960 පෙබරවාරි මස 24 දින,
කොළඹදීය.

---

## 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධිත 1950හේ අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත

### 5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

පහත විස්තර කරන ඉඩම මහජන කායයීයක් සඳහා අවශ්‍යයයි ද, එබැවින් එම පනතේ විධිවිධාන යටතේ එය අත්කර ගනු ලැබේ යයි ද කෘෂිකර්ම සහ ඉඩම් අමාත්‍ය විජයානන්ද දහනායක වන මම, 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධිත, 1950හේ අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි :—

මහනුවර දිස්ත්‍රික්කයේ පාතහේවාහැට ප්‍රාදේශීය ආදායම් කොට්ඨාශයේ ගුරුදෙණිය ගම්මුලාදෑනි වසමෙහි ගුරුදෙණිය ගමෙහි පිහිටි

ප්‍රමාණයෙන් පර්චස් 32.32ක් පමණවූ මෙහි පහත මායිම් සඳහන් ඉලුක්මෝදර වත්තෙන් කැබැල්ලක් :—

උතුරට : මහනුවර හාරගම-රිකිල්ලගස්කඩ ප්‍රසිද්ධ පාර ; දකුණට, නැගෙනහිරට සහ බස්නාහිරට : එම ඉඩමේ ඉතිරි කොටස්.

සඳහන් අංකය : ජේ 58/59 ඊ 473 ඇල් බී/ඊ/22.

ඩබ්ලිව්. දහනායක,
කෘෂිකර්ම සහ ඉඩම් ඇමති.

1960 පෙබරවාරි මස 28 දින,
කොළඹදීය.

---

අංකය :3/41/80.

## 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධිත 1950යේ අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත

### 5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

පහත විස්තර කරන ඉඩම මහජන කාර්‍යයක් සඳහා අවශ්‍යයයි ද, එබැවින් එම පනතේ විධිවිධාන යටතේ එය අත්කර ගනු ලැබේ යයි ද කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍ය විජයානන්ද දහනායක වන මම, 1954 අංක 39 දරන ඉඩම් අත්කරගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධිත, 1950යේ අංක 9 දරන ඉඩම් අත්කරගැනීමේ පනතේ 5 වෙනි වගන්තියේ (1) වෙනි උපවගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි :

මාතලේ දිස්ත්‍රික්කයේ, උතුරු මාතලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, උඩුගොඩ උඩසිය පත්තුවේ, සුදුහකුරුගම ගම්මුලාදෑනි කොටසේ, සුදුහකුරුගම ගමේ පිහිටි, බලගස්කුඹුරේහේන සහ බලගස් කුඹුරේවත්ත නමැති ඉඩම් වලින් (අවසාන ගම්සිතියම් 62 හි පිළිවෙළින් බිම් කට්ටි 22 සහ 23) වර්ග අඩි 3,150ක් පමණ බිම් ප්‍රමාණයක් ඇති බිම් කට්ටි දෙක සහ ඊට මායිම් :—

(1) **බලගස්කුඹුරේවත්තෙන් අඩි 115 × අඩි 15 ක පමණ බිම් ප්‍රමාණය** (අ. ග. සි. 62 බිම් කට්ටි 23).

උතුරට : බලගස්කුඹුරේහේන නමැති ඉඩමේ කොටසක් (අවසාන ගම්සිතියම් 62 බිම් කට්ටි 22 රජයට ගැනීමට යන ඉඩම්) ; නැගෙනහිරට සහ බස්නාහිරට : මෙම ඉඩමේ කොටස් ; දකුණට : මා/රුසිගම පාසැල් ඉඩම (රජයේ).

(2) **බලගස්කුඹුරේහේනෙන් අඩි 95 × අඩි 15 ක පමණ බිම් ප්‍රමාණය** (අ. ග. සි. 62 බිම්කට්ටි 22).

උතුරට : රුසිගම සිට පල්ලේපොලට ඇති ගම්කාර්යසභා පාර ; දකුණට : බලගස්කුඹුරේවත්ත නමැති වත්තෙන් කොටසක් (අ. ග. සි. 62 බිම්කට්ටි 23 රජයට ගැනීමට යන ඉඩම) ; නැගෙනහිරට සහ බස්නාහිරට : මෙම ඉඩමේ කොටස්.

ඩබ්ලිව්. දහනායක,
කෘෂිකර්ම හා ඉඩම් ඇමති.

සඳහන් අංකය : ජේ 58/59 ඊ 736.

1960 පෙබරවාරි 28 වැනි දින,
කොළඹ.

---

## සුධියක්

සඳහන් අංකය. ඇල්ඒ. 153.

1959 අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ සංශෝධිත ආඥපනතින් සංශෝධනයවූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබා ගැනීමේ පනත යටතේ 1958. 10. 6 වෙනි දින රජයේ ගැසට් පත්‍රයේ තුන්වෙනි කොටසේ පළවූ ගරු ඉඩම් සහ ඉඩම් සංවර්ධන ඇමතිවරයාගේ අංක ජේ 57 ඊ 260 හා 58. 9. 10 වෙනි දින කරන ලද ප්‍රකාශයේ දෙවෙනි ඡේදයේ දෙවැනි පෙළියේ "කරගහවෙල **ගම,** කරගහවෙල ගම්මුලාදෑනි කොටසට අයත් කබිල්ලෙවෙල දකුණ" **යන** වචන කපාහැර ඒවෙනුවට "**ඕබඩැල්ලෙගම,** ගම්මුලාදෑනි කොට්ඨාශ **අංක 65ඒ**" යන වචන යොදා කියවිය යුතුයි.

# ඉඩම් සංවර්ධන ආඥපනත යටතේ දැන්වීම්

## දීමනා පත්‍ර ලැබීමට සුදුස්සන් තේරීම පිළිබඳ ඉඩම් කච්චේරියේ දැන්වීමයි

මෙහි පහත විස්තර දක්වෙන ආණ්ඩුවේ ඉඩම් සඳහා දීමනා පත්‍ර ලැබීමට සුදුස්සන් තෝරා ගනු පිණිස බදුලු කච්චේරියේ දී 1960 මැයි මස 30 වෙනි දින පූ. භා. 9.30 ට 1935 යේ අංක 19 දරණ ඉඩම් සශ්‍රීක කිරීමේ ආඥපණත යටතේ ඉඩම් කච්චේයක් බදුල්ලේ ආණ්ඩුවේ ඒජන්ත තුමා විසින් පවත් වන බැව් මෙයින් දැනුම් දෙනු ලැබේ.

2. ඉඩම් කට්ටි ලබා ගනු කැමති සෑම අයෙකු විසින් ම ඉඩම් කච්චේරියට පැමිණිය යුතුය. නැතහොත් තමා වෙනුවෙන් පෙනී සිටීමට නියෝජිතයෙකු එවිය යුතුයි.

3. මේ ඉඩම් කච්චේරිය පිළිබඳව දැනගත යුතු යමක් ඇතහොත් එය ආණ්ඩුවේ ඒජන්ත තුමාගෙන් විභාග කළ යුතුය.

අයිවන් සමරවික්‍රම,
ඉඩම් කොමසාරිස් තැන වෙනුවට.

### දීමට යන ඉඩමේ විස්තර

**පැලැනේ අංකය හා ගම : අවසාන ගම්සිතියම් අංක 19, කිණිගම**

**කැබැල්ලේ අංකය : 245**

අවසරපත්‍ර දරන්නාගේ හෝ ඉල්ලුම්කරුගේ නම : ගල්ලේ ආරච්චිගේ දොන් පේද්‍රික් අප්පුහාමි ; ප්‍රමාණය : අ. 1, රූ. 1, ප. 05.

මෙම ඉඩම අවසාන ගම්සිතියම් අංක 19 බීටීඩීඇස්. පලැනේ අංක 129 දරණ බිම් කැබැල්ල වශයෙන් පෙන්වා ඇත.

**අවසාන ගම්සිතියම් අංක 193, කහත්තේවෙල**

**කැබැල්ලේ අංකය : 459 (කොටසක්)**

අවසරපත්‍ර දරන්නාගේ හෝ ඉල්ලුම්කරුගේ නම : ගල්ලේ ආරච්චිගේ දොන් පේද්‍රික් අප්පුහාමි ; ප්‍රමාණය : අ. 0, රූ. 2, ප. 39.4.

මෙම ඉඩම අංක 193 බීටීඩීඇස්. දරණ අවසාන ගම්සිතියමේ අංක 150 දරණ බිම් කැබැල්ල වශයෙන් පෙන්වා ඇත.

---

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

අංකය : ඇල්. ඇස්. 4413.

## 21 (2) වැනි රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කරන නිවේදනයයි

නුවරඑළිය දිස්ත්‍රික්කයේ කොත්මලේ ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ දෙලුන්තලාමඩ පිහිටි ඒ. 2044 දරණ මූලික පිඹුරයේ 2 වැනි බිම් කැබැල්ලෙන් පර්චස් 6 ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක් ගබඩාවක් ඉදිකිරීම සඳහා දෙලුන්තලා මඩ විවිධසේවා සමූපකාර සමිතිය විසින් බදු ඉල්ලා ඇති බැව් මහජනයා වෙත මෙයින් දැනුම් දෙමි.

2. අවශ්‍ය කාරණය සඳහා ඉඩම බදුදීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසි වලට අමතර වශයෙන් හා පහත සඳහන් කොන්දේසි වලටද යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :—

(අ) කාලය : අවුරුදු 30 යි ;

(ඉ) බද්ද : අවුරුද්දකට රු. 1 ශත. 50 යි ;

(උ) බදුගන්නා විසින් බද්ද ආරම්භ වූ අවුරුදු 1 ක් ඇතුලත ද නුවරඑළියේ දිසාපති තැනගේ සිත් ගන්නා පරිදි එකී ඉඩමෙහි ගබඩාවක් තනා නිම කළ යුතුය ;

(එ) බදු ගන්නා මෙම ඉඩම ගබඩාවක් තැනීම පිණිස විනා අන්‍ය කටයුත්තක් සඳහා නො යෙද විය යුතුය.

3. මෙහි පහත සඳහන් දින සිට සති හයක් ඇතුලත දී මෙම ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතු ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

වී. රාමනාදන්,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

1960 අප්‍රේල් මස 14 වැනි දින,
කොළඹ දීය.

අංකය: ඇල්. ඇස්. 4574.

## 21 (2) වැනි රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කරන නිවේදනයයි

වව්නියා දිස්ත්‍රික්කයේ කරුප්පඩ්ඩාසිමුරිප්පු හි පිහිටි අක්කර 2 ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක් කාර්යාලයක්, ගබඩාවක් හා එළවළු හා වී තවානක් ඉදි කිරීම සඳහා, කරුප්පඩ්ඩාසිමුරිප්පු විවිධසේවා සමූපකාර සමිතිය විසින් බදු ඉල්ලා ඇති බැව් මහජනයා වෙත මෙයින් දැනුම් දෙමි. ඉඩමෙහි මායිම් මෙසේය:—

උතුරට: ප්‍රසිද්ධ පාර; දකුණට: රජයේ කැලෑ; නැගෙනහිරට: රජයේ කැලෑ; බටහිරට: රජයේ කැලෑ.

2. අවශ්‍ය කාරණය සඳහා ඉඩම බදුදීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසි වලට අමතර වශයෙන් හා පහත සඳහන් කොන්දේසි වලටද යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ:—

(අ) කාලය: අවුරුදු 30 යි;

(ඉ) බද්ද: අවුරුද්දකට රු. 4 යි;

( උ) බදු ගන්නා විසින් බද්ද ආරම්භ වූ අවුරුදු 2 ක් ඇතුළත දී වව්නියාවේ දිසාපති තැනගේ සිත්ගන්නා පරිද්දෙන් එකී ඉඩමෙහි කාර්යාලයක්, ගබඩාවක් හා එළවළු හා වී තවානක් තනා නිමකළ යුතුය;

(එ) බදුගන්නා විසින් මෙම ඉඩම යථෝක්ත (උ) ඡේදයේ සඳහන් කාරණා පිණිස මිස අන්‍ය කටයුත්තක් සඳහා නොයෙද විය යුතුය.

3. මෙහි පහත සඳහන් දින සිට සති හයක් ඇතුලත දී මෙම ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතු ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

වී. රාමනාදන්,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

1960 අප්‍රේල් මස 14 වැනි දින,
කොළඹ දීය.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ, මුද්‍රණය කරන ලදී.